ඉරිදා මව්බිම පුවත්පතේ මනෝ චිකිත්සකවරයෙකු හා සාකච්ඡාවකින්ද පසුව, උසස් පාසල් සිහිනයක ආතතිය හේතුවෙන් මානසික සමබරතාවය බිඳ වැටුණු දරුවෙකු පිළිබඳ ලිපියක් පළවී තිබුණි. මෙම ලිපිය සැබවින්ම ධනාත්මක පණිවුඩයක් රැගත් එකක් බව නොකිවමනායි.
කෙසේ නමුත් මෙම ලිපියේ සිරස්තලය සඳහන්ව තිබුණේ "ශිෂ්‍යත්ව සිහිනයේ මවගේ පීඩාව ඉවසන්න බැරිව පිස්සු වැටුණු දරුවා" යනුවෙනි.
මානසික සමතුලිතතාවය බිඳ වැටීමක්, මානසික සංකූලතාවයක් හැඳින්වීම සඳහා "පිස්සු වැටීම" යන යෙදුම කෙතරම් උචිත වේද යන්න පැනයකි. මනෝ විද්‍යාව තුළ එවැනි යෙදුමක් ඔස්සේ මානසික රෝගයක් නොහැඳින්වෙන බව අපගේ විමසුමට පිළිතුරු දෙමින්, මෙම ලිපිය සඳහා සාකච්ඡා කළ මනෝචිකිත්සකවරයා විසින් මෙන්ම වෙනත් ක්ෂේත්‍රයේ ප්‍රවීණයන්ද අදහස් දක්වන ලදී.
සමාජයේ ඇතැමෙකු තුළ තවමත් මානසික සංකූලතාවයන් හෝ මානසික රෝගයන් සම්බන්ධයෙන් පසුගාමී අදහසක් පවතින අතර, ඔවුන් තුළ මනෝ වෛද්‍ය ප්‍රතිකාර හෝ උපදේශනය ලබාගැනීම සම්බන්ධයෙන් විචිකිච්ඡාවක් පවතී. එවන් පසුබිමකදී, මානසික සංකූලතාවයක් "පිස්සු වැටීමකට" ලඝු කිරීම ඔස්සේ මානසික ගැටළු ඇත්තවුන් තවදුරටත් කොන් වීමක් සිදුනොවන්නේද? එනිසා, මෙවැනි ධනාත්මක ආකල්පයක් ප්‍රවර්ධනය සඳහා ලියැවෙන ලිපියක් තුළ සෘණාත්මක අදහසක් ගෙන දෙන සිරස්තලයක් යෙදීමට පෙර පුවත්පත් සංස්කාරකවරයෙක් දෙවරක් සිතිය යුතු නොවන්නේද?
එසේම, ලිපියක් ලියන මාධ්‍යවේදියා විසින් නොව සංස්කාරකවරයෙකු විසින් ලිපියකට සිරස්තල යෙදීමේදී සිදුවන ගැටළු සම්බන්ධයෙන් අපි මින් පෙරද සාකච්ඡා කර ඇති බවද අවසානයට සඳහන් කරමු.
#MediaEthicsSL #lka #SinhalaPress #SundayMawbima